දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011- 2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info @psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No.: PSC/APL/1/AT/20

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2024.01. 19

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

**<u>2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනා වලට අදාල තීරණ</u>**
**<u>දීප ව්‍යාප්ත සේවා සහ ඒකාබද්ධ සේවා</u>**

දීප ව්‍යාප්ත හා ඒකාබද්ධ සේවාවන්හි තනතුරුවල සේවය කරනු ලබන නිලධාරීන්ගේ 2024 වාර්ෂික ස්ථානමාරුවලට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ මේ වන විට දැනුම් දී ඇත.

02. එහෙත් 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත විවිධ පාර්ශව වෙතින් ඉල්ලීම් ඉදිරිපත් වන අතර ඒ අතුරින් ඇතැම් ඉල්ලීම් ඔබගේ නිර්දේශයද සහිතව ඉදිරිපත් වනු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර තිබේ. මෙම පසුබිම තුළ 2024 වාර්ෂික ස්ථානමාරු යටතේ ලබා දී ඇති ඇතැම් ස්ථානමාරු චක්‍ර ක්‍රියාවට නැංවිය නොහැකි වී ඇති අතර ඒ අනුව අදාළ ස්ථාන මාරු චක්‍රවල සිටින ස්ථාන මාරු වී යාමට අපේක්ෂිත අනෙකුත් නිලධාරීන් අගතියට පත් වී ඇත.

03. වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ සම්බන්ධයෙන් අතෘප්තියට පත් වන නිලධාරීන්ට ඒ සම්බන්ධයෙන් 2002 අංක 04 දරණ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනත අනුව, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනා කිරීමේ හැකියාව පවතී. එහෙත් එම අභියාචනා සම්බන්ධයෙන් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ තීරණ ලැබෙන තෙක් අදාළ ස්ථාන මාරු චක්‍ර එලෙසින්ම ක්‍රියාත්මක විය යුතු බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දැනුම් දීම සඳහා යොමු කර ඇති ලිපියෙහි ද සඳහන් කර ඇත.

04. ඒ අනුව ඉහත සියළු කරුණු සැලකිල්ලට ගෙන, 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් නැවත නැවත රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලීම් ඉදිරිපත් නොකරන ලෙස සහ 2024 වාර්ෂික ස්ථාන මාරු යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අවසන් වශයෙන් ලබා දී ඇති නියෝග ප්‍රකාරව ඔබ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ සේවය කරන ස්ථාන මාරුවීම් ලබා ඇති නිලධාරීන් විධිමත් පරිදි වහාම සේවයෙන් නිදහස් කිරීමට කටයුතු කරන මෙන් එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වා සිටිමි.

ඩබ්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත්:

01. ජනාධිපති ලේකම් - කරු. දැ. ගැ. ස.
02. අමාත්‍ය මණ්ඩලයේ ලේකම් - කරු. දැ. ගැ. ස.
03. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ. ගැ. ස.